**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**
**பொது நிர்வாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு**
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils & Local Government**


**ස්වදේශ කටයුතු අංශය**
உள்நாட்டலுவல்கள் பிரிவு
**Home Affairs Division**

"නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05.
"நில மெதுர", எல்விடிகல மாவத்தை, கொழும்பு 05
**"Nila Madura", Elvitigala Mawatha, Colombo 05.**

TP : +94 112 050 450
Fax : +94 112 369 971
Email: info@moha.gov.lk
Web : www.moha.gov.lk


මගේ අංකය / எனது இல / My No: HA/02/22/11
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.07. 11

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**<u>රාජකාරී කටයුතු අතරතුර මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කරනු ලබන රැස්වීම් සම්බන්ධවයි.</u>**

ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ හා සහකාර ප්‍රදේශීය ලේකම්වරුන්ගේ සංගමයේ සභාපති විසින් ඔහුගේ අංක SLADA/PA/01 හා 2023.01.16 දිනැති ලිපිය මගින් තම රාජකාරී කටයුතු ඉටු කිරීමේ දී එම කටයුතු වඩාත් ප්‍රශස්ථ අයුරින් ඉටු කිරීම සඳහා මෙන්ම, ඔවුන් මුහුණ පාන ගැටළු සම්බන්ධයෙන් කරුණු දක්වා තිබූ අතර ඒ පිළිබඳව අදාළ සංගමයේ නිලධාරීන් කැඳවා 2023.04.26 දින මෙම අමාත්‍යාංශයේ දී සාකච්ඡාවක් පවත්වන ලදී.

02. මෙහිදී, අවධානයට යොමු කරන ලද එක් කරුණක් වූයේ විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් හදිසි දැනුම් දීම් මත කඩිනම් අවශ්‍යතාවයක් නොමැති සමහර කාර්යයන් සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ රැස්වීම් යොදා ගනු ලබන බවත් ඒ හේතුවෙන් සතියේ දින දෙකක් හෝ වැඩි ගණනක් එම රැස්වීම් සඳහා සහභාගී වීමට සිදු වීමෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සාමාන්‍ය රාජකාරී කටයුතුවලට බාධා පැමිණීම මෙන්ම කාර්යාලීය කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් යම් ගැටළුකාරී තත්ත්වයක් උද්ගතවන බවයි.

03. මෙම ගැටළුවට පිළියමක් ලෙස එලෙස මාර්ගගත රැස්වීම් පැවැත්වීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි රාජකාරී කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමට හැකිවන පරිදි මහජන දිනය හැර වෙනත් දිනයක් යොදා ගැනීම පිළිබඳව ඔබගේ අවධානය යොමු කරන අතර අවම වශයෙන් සතියකටවත් පෙර ඒ පිළිබඳව ඔවුන් වෙත දැනුම් දීම සඳහා කටයුතු කරන ලෙසටත් කාරුණිකව දන්වා සිටිමි.

**කේ.ඩී.එන්. රංජිත් අසෝක**

ලේකම්

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත : සභාපති (ශ්‍රී ලංකා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සංගමය) - කරු.දැ.ග.ස